දළදා වංශය.

Dalada Wansaya.

ආර්. ඩී. අල්විස්
විසින්

මහනුවර "ලඞ්කාප්‍රදීප" යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

1916.

සංඥාපත්‍රය.

මෙහි බුද්ධචරිතය හා ශ්‍රී බුද්ධ ශරීරය ආදාහනයකළ දිනෙහි ධාතු ශෙෂවූ තැන්පටන් මේ කාලය දක්වා දනට සෙංකඩගල (මහනුවර) දළදාමැදුරේ වැඩසිටිත එම් දළදාවහන්සේ පිළිබඳ කථා පිළිවෙළ ධර්මානුසාරයෙන් හා ඉතිහාසානුසාරයෙන් ඉතා සංක්ෂෙපකොට දක්වා තිබේ. තවද කීර්ත්ති ශ්‍රී මහරජතුමාගේ කාලයෙහි පටන් මේ කාලය දක්වා එම දළදාමැදුර භාරව වැඩසිටියාවූද, සිටින්නාවූද, මහානායක ස්වාමීන්වහන්සේලාගේ නාමයන් සහ ඒ ඒ කාලවල දියවඩන නිලයටපත් උතුමන්ගේ නාමයන්ද, ප්‍රධාන සිංහලොත්සවයන්ද යනාදි මින්පෙර ප්‍රසිද්ධනුවූ කාරනා රැශියක් මෙහි දක්වා තිබේ

පොතපතෙහි විස්තරව තිබෙන කාරනා රැශියක් කොටකර මෙවර ප්‍රසිද්ධකළ නමුත් විස්තර සහිත පොතක් නැවත ප්‍රසිද්ධකිරීමට බලාපොරොත්තුවන්නෙමු.

අපේ ආරාධනාවෙන් අපේ අදහස්පරිදි කාටත් අවබොධවන ඉතා ලිහිල් භාෂාවෙන් මෙම පොත

සම්පාදනය කර දුන් මහනුවර අස්ගිරි මහවිහාර වාසී ගෞරවනීය පොල්ගහඅඹගේ ධම්මසිද්ධි ස්ථවිර යන්වහන්සේට හා එය කරුණාවෙන් පිළිගත් පුස්වී බණ්ඩා නුගවෙල දියවඩන නිලමතුමන්ටද අපගේ අවඞ්කා ස්තූතිය පුදකරමු.

මෙහි යම් ප්‍රමාදස්ථාන ඇතිවුව හොත් එවැන්නෙහි සජ්ජනයෝ සමාධිය භජනය කෙරෙත්වා.

තවද මෙම පොත මෙසේ හෝ අන්කොයි ක්‍රමය කින්වුවත් මගේ අවසරක් නොමැතිව ප්‍රසිද්ධ කිරීම තහනම්කළ බවද සැලකිය යුතුයි.

මේවගට,

ආර්. ඩී. අල්විස්.

වර්ෂ 1916 ක්වූ දෙසැම්බ්‍ර මස 1 වෙනි දින මහනුවර නිරිකු නාමල වීදියේ No. 308 දරන ගෘහයේ දීය.

මෙම පොත

සමාදන විනිශ්චයකාරධුරන්ධර මහනුවර ශ්‍රී දංෂ්ට්‍රා

ධාතුමන්දිරයේ දියවඩන නිලය සහ හාරිස්පත්තුවේ

රටත් ලැබී කරවන

රාජකරුණා චන්ද්‍රසේකර වාසල

මුදියන්සේ රාළහාමිල්ලාගේ

පුංචි බණ්ඩා නුගවෙල

මන්ත්‍රීශ්වරයන්ට

ඔප්පුකරනලදි.

THIS BOOK IS DEDICATED

TO

Rajakaruna Chandrasekara Wasala

Mudiyanseralahamillage

Punchi Banda Nugawela. Esq., J. P.,

Diyawadana Nilame of the

Dalada Maligawa, Kandy, and

Rate Mahatmaya of Harispattuwa.

දළදා වංශය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

ශ්‍රීමත් ගෞතම බුදුරජාණන්වහන්සේ දීපං
කර නම් සම්බුදුන්වහන්සේගේ කාලයෙදි සුමෙධ
නම් තාපසව ඒ බුදුරජාණන්වහන්සේගෙන් නියත
විවරණලබා එතැන් පටන් ලබනලද සුවිසිවිවරණ
සත් ඇතිව සසර සැරිසරා අවුත් වෙස්සන්තරකල
අඹුදරුවන් දන්දී තුසිපුර ඉපිද දෙවියන්ගේ ආරාධ
නාවෙන් ශුද්ධෝදන මහරජු නිසා මහාමායා දේවින්
කුස පිළිසිඳ ඒකාලයෙහි ව්‍යවහාර කලියුග වර්ෂයෙන්
1447 ක්වූ වර්ෂයෙහි දැනට කොහානා නමින් ප්‍රසිද්ධ
“රෝහිණී” නදීතීරයෙහි පිහිටි කපිලවස්තු නගරයෙ
හිවූ ලුම්බිනී නම් මඟුල්සල් උයනෙහිදී වෙසක් මස
පුරපසළොස්වක් පොහොයලත් අඟහරුවාදා විසාකා
නකතින් උපන්සේක.

පින්පෙඩක් බඳු ඒ සිද්ධාර්ථකුමාර තෙම ක්‍රමයෙ
න් වැඩිවිය පැමිණ යශෝධරා දේවිය සරණකොට

ගෙනසිට විසිනව (29) වෙනි වයස්වූ අවුරුද්දෙහි
රාහුල කුමාරයා උපන් දින ඇසළ මස පුරපසළොස්
වක්දා මධ්‍යම රාත්‍රියෙහි උතුරුසළ නකතින් මහාබි
නික්මන්කොට අනෝමානම් ගංගාතීරයෙහිදී මහණව
එතැන් පටන් අවුරුදු හයක් දුෂ්කරක්‍රියාකොට (දුකි
න්සිට) තිස්පස්වෙනි වයසෙහිදී වෙසක්මස පුරපස
ළොස්වක්දා සවස දඹදිව ජයමහාබෝධීන් වහන්සේ
කරා එළඹ නැගෙනහිරට මුහුනලා වැඩහිඳ අනතුරු
කිරීමට පැමිණි සතුරුවූ මාරයන් පරදවා එදින අළු
යම් වෙලෙහි ලොව්තුරා බුද්ධත්වයට පැමිණ වදාළසේ
ක. මෙසේ බුදුවූ ගෞතම සර්වඥයන්වහන්සේ ඉසිප
තනාරාමයෙහිදී දම්සක් පැවතුත් සූත්‍රය දෙසනාකො
ට එතැන්පටන් හතලිස්පස් (45) අවුරුද්දක් මුළුල්
ලෙහි ඒ ඒ ගම් නියම්ගම්හි සැරිසරු ධර්මදේශනාකො
ට සියළු බුද්ධකෘත්‍යයන් නිමවා (බුදු කෙනෙකුන් විසි
න් කළයුතු සියල්ල නිමවා) අසූවයස් (80) පිරුණුකා
ල ගම් නියම්ගම් පිළිවෙළින් කුසිනාරා නුවරට වැඩ ඒ
නුවර සමීපයෙහි පිහිටි "මල්ල" නම් රජුන්ගේ සල්
උයනෙහි උතුරු දෙසට හිසලා පැනවූ අස්නෙහි නව
ත් නොනැගිටිනා අනුඨාන සෙය්‍යාවෙන් සැතපී අනු
පාදිශේෂනිර්වාණධාතුවෙන් පිරිනිවන්පා වදාළසේක.

ඉක්බිති දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යාදීන් විසින් නොයෙ

සතියක්පවත්වා සත්වෙනි දින
ක් පූජාපෙරහර "මල්ල" රජුන්ගේ මොටුනු පලඳින ස්ථානයට පෙරහ
රින් වැඩමවා රන් (ඔරුවක) දෙණක බහා සඳුන්දර
සෑයට වැඩමවනලදි ඒ සෑයෙහි ගිනි නොදැල්වී තිබී
මහාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ සිරිපා වැඳපුදා
ගත් පසු තොමෝ (ඉබේ) ම ගිනිගෙන ශ්‍රී ශරීරය
ආදාහනවිය. සරභූනම් රහතන්වහන්සේ විසින් ග්‍රීවා
ධාතුව දරසෑයෙන් ගෙනගොස් මහියඞගණ චෛත්‍ය
යෙහි තබා සෑයක් කරනලද්දේය.

මෙසේ සර්වඥ ශ්‍රී දෙහය දැගියකල සතර දළදාවහන්
සේද, අකුධාතු දෙනමද, ලලාට ධාතුන්වහන්සේද, ය
න සත්නම බුදුරජාණන්වහන්සේගේ අධිෂ්ඨානයෙන්
නොවිසුරුණාහ. සෙසු ධාතූන්වහන්සේලා අබඇට, සු
න්සාල්, මුංබියලි, යන තුන් පමණටවිය ඒ ධාතූන්නි
සා අට රටකින් යුදපිණිස පැමිණි රජවරු "ද්‍රොණ"
නම් රජගුරු බ්‍රාහමණයා විසින් සනසා සියළු ධාතූ
න් දෙනැළිය බැගින් බෙදාදෙනලදි.

සතර දළදාවහන්සේ අතුරෙන් දකුණු දළදාවහ
න්සේ ද්‍රෝණ නම් බ්‍රහමණතෙම ධාතු බෙදමින් සිට
රජවරුන්ගෙ ප්‍රමාදයක්දැක හිස්මුදුනේ හිසකේ අතු
රෙහිහි සඟවාගත්තේය ඒ දුටු සක්දෙව්රජතෙම ඔහු
ට නොදන්වා එයින් ගෙනගොස් දෙව්ලොව සිළුමිණි

සෑයෙහි තබා අදදක්වා දෙවියන් විසින් පුදනුලැබේ. ඉතිරි දළදාවහන්සේලා තුන්නම අතුරෙන් එක් දළදාවහන්සේ නමක් ගන්ධාර රට රජුන්ගේ ධාතු කොටසටද, එක් ධාතූන්වහන්සේ නමක් රාමග්‍රාම රාම රජුන්ගේ ධාතු කොටසටද බෙදුනේය. රාම රජුන්ගේ එම දළදාවහන්සේ ඇතුළු ධාතු කොටස නාලොව දිව්‍යනාගරාජයන්ට අත්වීය. දුටුගැමුණු රජකල සෝණුත්තර නම් රහතන්වහන්සේ විසින් එම ධාතු කොටස නාලොවින් අනුරාධපුරයෙහි “රුවන්වැලි” මහාචෛත්‍යයෙහි ධාතු නිධානය පිණිස ගෙනෙනලදි.

වම් දළදාවහන්සේ

වනාහි ශ්‍රී බුද්ධශරීරය දරසෑයෙහි දැවෙද්දීම “ඛෙම” නම් රහතුන්වහන්සේ විසින් සෘද්ධ්‍යානුභාවයෙන් හැරගන්නාලදි. එම වම් දළදාවහන්සේත් රැගෙණ යථොක්ත රහතන්වහන්සේ “කාලිඟුරට” දන්තපුරයට වැඩමවා එකලට එහි රජ පැමිණි බ්‍රහමදත්ත නම් රජුකරා එළඹ ධර්මදෙශනාකොට බුද්ධාගමෙහි පිහිටුවා ඒ දළදාවහන්සේ ඒ රජහට දෙවාවදාළසේක. ඒ රජතෙම ඉතා ආදරයෙන් පිළිගෙණ අලංකාර දළදා

මාලිගාවක් කරවා එහි වඩාහිඳුවා පූජාසත්කාර කළේය. ඉක්බිති ඒ රජහුගේ ඇවෑමෙන් ඒ රජහුගේ පුත්‍ර "කසී" නම් රජ්ජුද, ඒ රජහුගේ පුත්‍ර "සුනන්ද" නම් රජ්ජුදැයි යනාදී බොහෝ රජවරු ඒ ධාතූන්වහන්සේට පුදසිරිත් පවත්වා පින් රුස්කර ගත්හ. ඊට පසු ඒ රාජවංශයෙහිම අන්‍ය ආගමක පිහිටි මිථ්‍යාදෘෂ්ටි "ගුහසීව" නම් රජෙක් රජවිය, ඒ නුවරවාසී බුද්ධාගමිකාරයන් විසින් කරනලද දළදාපෙරහර දැක අමාත්‍යයන්ගෙන් මේ කුමන පෙරහරක්දැයි අසා ඒ අමාත්‍යයන් විසින් ඒ දළදාවහන්සේගේ හා බුද්ධාගමේද ගුණකී කල්හි සතුටුව බුද්ධාගම පිළිගෙන දළදාවහන්සේටද ඉතා ආදර පූජා සත්කාර කරන්ට පටන්ගත්තේය. ඒ ගුහසීව රජු අදහමින් සිටි නිගණ්ඨයෝ තම නුවරින් පිටවහල් කළේය, හෙවත් රටින් පන්නා හැරියේය.

මේ කාලයෙහි දඹදිවට අධිපති මිථ්‍යාදෘෂ්ටිය පිළිගත් "පාණ්ඩු" නම් අගරජෙක් (Emperor) පැළළුප් නුවර වාසයකළේය. ගුහසීව රජු විසින් පන්නාහරිනලද නිගණ්ඨයෝ එම අගරජුකරා එළඹ, ස්වාමීනි නුඹවහන්සේට යටත් ගුහසීවරජු නුඹවහන්සේ අදහන උතුම් බ්‍රහ්මාගම හැරදමා මිනී ඇටයක් තබාගෙන පුදසිරිත් පවත්වන්නේයයි කීවෝය. ඒ

වචනයට කිපුනාවූ එම අගරජ තමන් ලඟසිටි "චිත්‍ර
යාන" නම් අවශෙෂ රජෙක්හට කථාකොට, චිත්‍රයා
නය කලිඟු රටට ගොස් ගුහසීවයා හා ඔහු පුදන මිනී
ඇටයත් වහා ගෙනවයි අණකලේය. එකෙණෙහි ඒ
රජතෙම සිව්රඟසෙනග පිරිවරා එහිපැමිණිකල ඒ ප්‍ර
වෘත්තිය ඇසූ ගුහසීවරජතෙම අමාත්‍යයන් මඟටයවා
ඔහුගේ සිත සන්තොෂකරවා තම රජගෙට] කැඳවීය
එකල ගුහසීව රජුවෙත පැමිණි චිත්‍රයාන රජතෙම
අගරජුගෙන් ලැබුනු අණාඥව මෙසේ කීයේය-එනම්,
"තොප හා තොප පුදන මිනී ඇටයත් ගෙනයාමට
අප මහරජුගෙන් අණලැබූ මම ඒ සඳහා ආමියි කී
යේය." ඉක්බිත්තෙන් ගුහසීව රජු විසින් බුඩාගමේ
හා ධාතුන්වහන්සේගේ ගුණද වර්ණනාකල පසු
දළදාවහන්සේගේ ප්‍රාතිහාර්‍යයද දුටු ඒ රජ සහිත
සියළු සෙනාවෝම බුඩාගම වැළඳගත්හ ධාතුපූජාද
කලෝය, එසේනමුත් මහරජුහුගේ අණාඥාවලෙස ඒ
රජුන් දෙදෙනා හා සෙනාවෝත් ධාතූන්වහන්සේ
අලංකාර රථයක තබා පෙරහරින් පැලළුප් නුවරට
පැමිණ පාණ්ඩව රජහට පෙණී සිටයාහ.

එකල ගුහසීවරජු දැක කිපියාවූ අගරජතෙම මො
හු විසින් දළදාවහන්සේ කියකියා පුදන මිනීඇටය
ගෙන කිකිරි අඟුරු නොඩක දමා පුළුස්සා හළුකරවයි

ඒ කේලාම් කී නිගණ්ඨයින්ට නියම කෙළේය. ඒ ඇසූ හැටදහසක් නිගණ්ඨයෝ රජගේ මිදුලේ වලක් සාරා කිහිරි අඟුරු පුරවා ධාතූන්වහන්සේ එහි දමූහ එකෙණෙහි රශ්මිකාක් (කරතාන රෝදයක්) පහළ මහපියුමක් පැනනැගිකල්හි ධාතූන්වහන්සේ එහි වැඩසිටිසේක. ඒ දුටු බොහෝ අන්‍යාගමිකාරයෝ බුද්ධාගම පිළිගත්තෝය, මහරජ තෙම ඊටද නොපැහැදී කිණිහිරක් මත්තෙහි තබා කුළුගෙඩියකින් ගැස්විය එකල කිණිහිරෙහි ගැලී වැඩසිටිසේක. ඒ දුටු රජතෙම මදක් විස්මයට පත්විය එවිට වහා නිගණ්ඨයෝ රජු ළඟට පැමිණ, දෙවයෙනි මේ පුදුමයක්ද? අපේ විෂ්ණු දෙවියෝ ලොවැඩ පිණිස තබනලද දෙයක් නිසා මෙසේ ආනුභාව ඇත්තේයයි කියා රජු රැවටීමට තැත් කළහ. මෙසේ කියමින් ධාතූන්වහන්සේ එයින් ගැණීමට උත්සාහකළ නමුත් නොහැකිවීය. ඒ දුටු පාණ්ඩු රජතෙම ඔවුන්ට නින්දාකොට යමෙක් අද මේ කිණිහිරෙහි ගැලීසිටිනා ධාතූන්වහන්සේ එයින් මෑත්කොට දෙන්නේනම් ඔහට රජුගෙන් මහත් යස ඉසුරු ලැබෙන්නේයයි ඒ නුවර අණබෙර ප්‍රසිද්ධකරවීය එකල අනේපිඬුසිටාණන්ට මුනුබුරු "සුභද්‍ර" නම් සිටු කෙණෙක් ඒ හඬ අසා ඒ මහා පිරිස් මැදට පැමිණ ධාතූන්වහන්සේට නමස්කාර කොට අනේ

පිඩු සිටාණන් තමන්ගේ මී මුත්තණුවන් බවහා අපමණ බුදුගුණද කියා මේ ඒ බුදුරජාණන්වහන්සේගේ දළදාවහන්සේමය මේ මාකී ගුණ සැබෑතම් වහා කිණිකිරෙයෝ අහසට වැඩ ප්‍රාතිහාර්‍ය පාණසේක්වයි ආරාධනා කල කල්හි වහා අහසට වැඩ ප්‍රාතිහාර්‍ය්‍ය දක්වා සිටාණන්ගෙ හිසපිට වැඩසිටිසේක. නිගණ්ඨයෝ ඒ දූකත් මේ සිටුහුගේ මන්ත්‍රාණුභාවයකින්යයි කීවෝය. ඉක්බිති සිටුතෙම ධාතුව සුවඳපැන් පිරූ පාත්‍රයක්ට වැඩමවිය ධාතූන්වහන්සේ එහි කර කැවෙමින් කිමිදිමින් මතුවෙමින් ප්‍රාතිහාර්‍ය්‍යකළසේක.

ඊට පසු නිගණ්ඨයෝ ඒ නුවර මැද වලක් සාරා දළදාවහන්සේ එහි යටකර පස්වසා ඇතුන් ලවා පෑගවූහ එකෙණෙහි රථරෝදයක් පමණ නෙළුම් මලක් ධාතූන් වහන්සේත් වැඩමවාගනම පොළවින් පැන නැංගේය. ඒ දුටු සත්වයෝද අපමණ සතුටුවූහ

නැවතත් ඒ නිගණ්ඨයෝ දළදාවහන්සේ කුණු පිරූ අගලක දැමූහ එකෙණෙහි ඒ අගල පස්පියුමෙන් අලංකාරවිය වෙනත් අප්‍රමාණ ප්‍රාතිහාර්‍ය්‍යද සිඩවිය මේ සියළු කාරණු දුටු අගරජු අමාත්‍යයන්ගේ වචනයන් පිළිගෙණ බුඩාගම වැළඳගෙන දළදාවහන්සේට

නොයෙක් පුද පෙරහරකොට ගුහසීව රජුට භාරදී ඒ අගරජු මහණව පින්රැස්කොට දෙව්ලොව උපන්නේය.

ගුහසීව රජ දළදාවහන්සේ තම නුවරට වැඩම වා පුදසිරින් පවත්වමින් සිටිනාකල, උදේනි රජ පුත්‍ර කුමාරයෙක් එහි පැමිණ දළදාවහන්සේට ආදර යෙන් පුදසිරින් පවත්වමින් කල්යවන බැව් දුටු ඒ ගුහසීව රජුද ඉතා සතුටුව "හේමමාලා" නම් තම දුව සරණකර දුන්නේය. දළදාවහන්සේ ගැණීමට ආසාවක් ඉපදවූ "ක්ෂීරධාර" නම් අන්‍යරජෙකුගේ බෑනණු කෙනෙක් අපට ධාතූන්වහන්සේ දෙන්ටය නැතහොත් යුධකරන්ට එන්ටයයි කියා ලියමනක් ගුහසීව රජුවෙත යැවීය. ඉක්බිති ඒ රජතෙම බෑනණු දන්තකුමරුට හා හේමමාලා නම්දුවටද දළදා වහන්සේ භාරදී යුධයෙන් පැරදුනොත් දළදාවහන් සේත් රැගෙන 'ලක්දිවට" යව්යයි නියමකොට ඒරජ යුධයෙන් මළේය ඒබැව් දැනගත් එම අඹුසැමි දෙදෙන

දන්ත ධාතූන් වහන්සේ ලංකාවට වැඩමවීම

පිණිස ගෙන ගංතෙරකට පැමිණීපසු එක් රහතන්

වහන්සේ නමක් එහි පැමිණ 'තොපට යම් භයක් පැ
මිණියහොත් එවිට මා සිහිකරව්යයි' වදාරා වැඩිසේක.
ඉක්බිති "මණිඛුහාර" නම් නාග රජයෙකුගෙන්වූ
භය උන්වහන්සේ සිහිකිරීමෙන් දුරලා ගෙන ඒ
දළදා කරඬුව හේමමාලා නම් කුමරිය හිසමුදුන බඳින
තොණ්ඩුය තුල තබා බැඳගෙන "කාමලිංගමු" නම්
තොටින් නැව්නැග මුහුදමැදදී නාගයන් විසින් කර
නලද නොයෙක් පූජාවන්ගෙන්ද, ප්‍රාතිහාර්‍යයන්
ගෙන්ද, යුක්තව ගෙණඑන අතර නැවිත නාගයන්
විසින් නැව ගා නොදී වලක්වනලදුව පූර්වෝක්ත රහ
තන්වහන්සේ සිහිකිරීමෙන් නිරුපද්‍රව ශ්‍රී බුද්ධ වර්ෂ
854කුවූ අවුරුද්දෙහි ලංකාපට්ටුනට ගොඩබැස ක්‍රමයෙ
න් අනුරාධපුරයට ගොස් "මෙඝගිරි" විහාරයෙහි වැඩ
වසන මහතෙරුන්වහන්සේට දැන්වූ කල්හි උන්වහ
න්සේ විසින් එකලට රාජ්‍යශ්‍රීයට පත් ශ්‍රීකිත්සිරිමෙඝ
නම් මහරජහට දැන්විය, ඉතා සන්තොෂයටපත් ඒ
රජතෙම වහා එහි පැමිණ අප්‍රමාණ පූදසිරිත් පවත්
වා අනුරාධපුර දළදාමාලිගාවක් කරවා එහි වැඩමවා
මහජනයාටද පෙන්වා ඉතා ආදරයෙන් රක්‍ෂාකෙලේ
ය. එතැන්පටන් පිළිවෙළින් එහි රාජ්‍යශ්‍රීයට පැමි
ණි රජවරුන් විසින් නොයෙක් පූදපෙරහර කරමින්
කල්යවනා අතර ශ්‍රී. බු. ව. 1609, ක්‍රි. ව. 1065 වෙනි

වර්ෂයෙහි ලංකාරාජ්‍යශ්‍රීයටපත් පළමුවෙනි විජයබාහු රජ විසින් පොළොන්නරුවෙහි දළදා මාලිගාවක් කරවා දළදාවහන්සේ එහි වැඩමවකාලදී එසිදීද පිළිවෙළින් රජවරු පුදසිරිත් පැවැත්වූහ.

ශ්‍රී. බු. ව. 1766 වෙනි වර්ෂයෙහි පරදේශික කාලිංගමාඝ නම් මිථ්‍ය රජෙක්විත් බුද්ධාගම විනාශ කරන්ට පටන්ගත්කල්හි වාගීශ්වරාදී ස්ථවිරවරු දළදාවහන්සේ ගෙන අවුත් කොත්මලේ එක් ස්ථානයක නිධාන්කළහ. ශ්‍රී. බු. ව. 1787 රාජ්‍යයටපත් තුන්වෙනි විජයබාහුරජු විසින් කොත්මලෙන් ගෙන බෙලිගල දළදාමාලිගාවක් කරවා එහි වඩා පිත්රුස්කාර ගත්නාලදි.

ශ්‍රී. බු. ව. 1791 ක්‍රි. ව. 1267 වෙනි වර්ෂයෙහි ශ්‍රී ලංකාරාජ්‍යයට පත්වූ කාලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමන්විසින් දඹදෙනිපුර දළදාමාලිගාවක් කරවා එහි වැඩමවා අපමණ රන්රුවන් ආදියෙන් හා නොයෙක් කොණ්වත් ආදිය පුදා පිත්රුස්කොට මිය පරලොව ගියේය.

ශ්‍රී. බු. ව. 1826 ක්‍රි ව. 1381 වන වර්ෂයෙහි රජවූ බෝසත් විජයබාහු රජු විසින් දළදාවහන්සේ නැවත පොළොන්නරුවට වැඩමවනලදි. ඊට පසු බු. ව.

1828 ක්‍රි. ව. 1303 රජසිරි පැමිණි පළමුවෙනි බුව නේකබාහු රජු විසින් යාපව්නුවරට වැඩමවනලදි.

එකල දඹදිවින් පැමිණි ආයසීවක්‍රවර්ති නම් දෙමල අමාත්‍යයෙක් එම ධාතූන්වහන්සේ දඹදිව පඬිරටට ගෙන ගියේය. බු. ව. 1839 – ක්‍රි. ව. 1314 වන වර්‍ෂයෙහිදී රාජ්‍යයටපත් පරාක්‍රමබාහු රජු විසින් දඹදිවින් දළදාවහන්සේ වැඩමවා පොළොන්නරු දළදාමාලිගාවටම වැඩමවනලදි.

ශ්‍රී. බු. ව. 1846 රජතනතුරට පැමිණි පණ්ඩිත පරාක්‍රමබාහු රජ විසින් හස්තිශෛල පුරයෙහි (කුරුණෑගල) දළදාමාලිගාවක් කරවා දළදාවහන්සේ වැඩමවා “දළදාධාතුචරිතය” නම් පොතක් සාදා ඒ අනුසාරයෙන් පුදසිරිත් පවත්වනලද්දේය. මෙසේ පිළිවෙළින් රජදරුවන් පුදසිරිත් පවත්වා එන අතර ශ්‍රී බු. ව. 1953 වැන්නෙහි රජ පැමිණි ශ්‍රී පරාක්‍රමබාහු මහරජතුමාණන් විසින් ජයවර්ධනපුර (කොට්ටේ) දළදාමාලිගාවක් කරවා එහිවඩා පින්කම් කරමින්සිට ඒ රජතෙම මියපරලොව ගියේය.

මෙසේ පසුවෙනකල්හි සීතාවක රජකළ පළමුවෙනි රාජසිංහ රජ ශාසන විනාශයට පටන්ගත්තේය. එකලට සිටි ස්ථවිරයන්වහන්සේලා දළදාවහන්

සේ ගෙන සබරගමුවේ දෙල්ගමු විහාරයෙහි සඟවා තැබූහ.

බු. ව. 2135 රාජ්‍යශ්‍රියටපත් විමලධර්මසූර්‍ය රජතුමා දන්තධාතූන්වහන්සේ කොහේදැයි සොයා දෙල්ගමු වෙහෙරබව දැන සේනා සහිතව එහි ගොස් දළදා වහන්සේ මහපෙරහරින් වැඩමවා ගෙණ තමන් විසින් කරවනලද ශ්‍රී සෙංඛණ්ඩශෛල ශ්‍රීවර්ධනපුර මහනුවර දළදා මාලිගාවට වැඩමවා අප්‍රමාණ වස්තු වෙන් පුද පූදසිරිත් නියමකරවිය. ඊට ඉක්බිතිව රාජ්‍යශ්‍රියටපත් සෙනරත්, දෙවෙනි විමලධර්මසූර්‍ය, ශ්‍රී පරාක්‍රම නරේන්ද්‍රසිංහ, ශ්‍රී විජයරාජසිංහ යන මහ රජවරුද පිළිවෙළින් ගම්බිම් ආදිය පූද ආදරයෙන් දන්ත ධාතූන්වහන්සේ රක්‍ෂාකළහ.

ශ්‍රී. බු. ව 2287 වන වර්ෂයෙහි සෙංකඩගල (මහනුවර රාජ්‍යශ්‍රියට පැමිණි බුද්ධාඞ්කුර කීර්ත්තිශ්‍රීරාජසිංහ මහරජතුමාණෝ දන්ත ධාතූන්වහන්සේ සියදිවිමෙන් ආරක්‍ෂාකරන්නෝ දිනක් පාංසං ධාතු පූජා කරමින් සිටිනා අතර ශ. ව 1586 වන වර්ෂයෙහි ඕලන්දයින් ගෙන් පැමිණි යුද්ධභය නිසා එවකට අස්ගිරි විහාරාධි පතිව වැඩවිසූ කෝබ්බෑකඩුවේ ධර්මදර්ශී මහානායක මා හිමියන්වහන්සේ රාජඥා පරිදි දන්ත ධාතූන්වහන් සේ රැගෙන දුම්බර මැදමහනුවර ආදී වනප්‍රදෙශවලට

වැඩමවා ආරක්ෂාකළේය. යුධභය පහව ගියකල එම නරශ්‍රේෂ්ඨයාණන් විසින් දළදාමැදුර සුධකරවා රන් කරඬු නොයෙක් අනගි මාණික්‍යයෙන් අලංකාර කර පා දළදාවහන්සේ වැඩසිටිය වනප්‍රදෙශයට ගමන්සිඩ කොට දනත ධාතූන්වහන්සේ නැවත එම දළදා මන්දිරයටම වැඩමවා ගෙනවුත් කරඬු එකක් අනිකක්තුල තිබෙනසේ පිළියෙළකරනලද කරඬුතුලට වඩා එතැන් පටන් ජීවමාන සර්වඥයන්වහන්සේට ආනන්ද ස්ථවිරයන්වහන්සේ විසින් යම් උපස්ථානයක් කරනලද්දේද, දනත ධාතූන්වහන්සේටද එසේම එම සිරිත් පවත්වා ආරක්ෂාකරනසේ උභය විහාරාධිපති මහානායකානුනායක මහසංඝනට භාරදෙනලද්දේය.

තවද දළදාවහන්සේට මෙහෙකරුවන් නියම කොට ඔවුන්ට වැටුප් පිණිස ගම්බිම් කෙත්වත්දී බුදුසසුන පවතිනාතෙක් රාජ නියොගලෙස දළදා වහන්සේට පුදසිරිත් නොකඩව පවත්වනලෙස ආඥකරනලදි.

මෙසේ අප්‍රමාණ පූජා විධානකොට මධ්‍ය දෙශවාසීන්ගේ 'ශ්‍රාවණී' පූජාවයයි නම්ලද දේව පූජාපෙරහර පවත්වන අතර වැලිවිට සරණඞකර සංඝරාජ මාහිමියන්වහන්සේ ප්‍රධාන සංඝානුශාසනාවෙන් එම රජුණන් විසින් එම පෙරහරට පෙරටුව(දනට පවත්නා)

දළදා පෙරහැර පවත්ගන්නා ලද්දේය. තමගත පැ
ළඳි සියළුම රුජ (දැනට දළදා කරඬුවට පළඳා තිබෙන)
ආභරණයන් දළදාවහන්සේට පූදා සියළු දළදා කෘතය
යන් නියමකොට සවගීසළුවීය.

බු. ව. 2322 ක්‍රි. ව 1781 දී රජබවට පැමිණි ශ්‍රී
රාජාධිරාජසිංහ මහරජාණන් විසින්ද පෙරනියම පිළි
වෙළින් ධාතුපූජා පවත්වා තම දෙහ ප්‍රමාණයට පස්
ලෝ වාත්තුවෙන් (දැනට පල්ලේමාලේ වැඩසිටින)
පිළිමයක් කරවා පිත්රුස්කොට මියපරලොව ගියේය.

බු. ව. 2340 ක්‍රි. ව. 1799 දී අන්තිම රජවූ ශ්‍රී
වික්‍රමරාජසිංහ රජතුමාණෝද සියදිවිමෙන් ධාතුආර
ක්ෂාකොට දළදාමැදුර ඉදිරියෙහි පත්තිරිප්පුව කරවා
(දැනට අඹාලම තිබෙන) ගල්තොරණාදිය කරවිමින් සි
ටිනා අතර වර්ෂ 1815 දී ඉංග්‍රීසීන් ලංකාරාජ්‍යය ලැබග
ත්පසු දළදාවහන්සේට අනතුරු සිදුවේදැයි සැක
කොට එවකට පත්වසිටි උභය විහාරාධිපති මහානාය
ක සථවිරෙපාතාමයන් ප්‍රමුඛ සංඝසම්මතයෙන් හා දිය
වඩන නිලමතුමාගේත් අනුමතයෙන් අස්ගිරි විහාර
යෙහි වැඩසිටි වාරියපොළ ශ්‍රී සුමඞ්ගල නායක සථ
විරයන්වහන්සේ දළදාවහන්සේ වැඩමවාගෙණ දඹුළු
වනය ආදි කැලෑවල හැසිරෙමින් පූදසිරිත් පවත්වා
ගෙන සිටිනා අතර ඒ බව දැනගත් ඉංග්‍රීසි ආණ්ඩුව

විසින් දළදාවහන්සේ ගෙන්වා එම දළදා මැදුරෙහි තබා ආණ්ඩුවෙන් ආරක්ෂාකරමින් සිට බු. ව. 2372 දී සර් එඩ්වඩ් බාර්න්ස් ගරුතර උතුමාණන්වහන්සේ ගේ අනුමතයෙන් මෙහි පහත පෙණෙන අවසර පත්‍ර යෙහි ප්‍රකාර මහනුවර දළදා පෙරහර නැවතත් පටන්ගන්නා ලද්දේය.

Notice is hereby given that a Dalada Pincama will be held at Kandy with the sanction of Government on Thursday the 29th proximo and the sacred Relic exhibited at the Maligawa to all persons who may desire to attend and make offerings

Kandy Kachcheri, **Sgd—George Turnour,**
25th April, 1828 *Rev. Commr.*

මෙහි අදහස මෙසේයි.—ලබන මස 29 වෙනි දින බෘහස්පතින්දා ආණ්ඩුවේ අවසරපිට මහනුවර දළදා පින්කමක් කරනබවත් එහිපැමිණ ඊට පුදපූජා කරන්ට කැමති අයවලුන්ට ඒ දළදාවහන්සේ මාලිගාවෙදී පෙන්වාදෙන බවත් මෙයින් දැනුම්දෙමි.

අත්සන්කලේ—ජෝර්ජ් ටර්නර්,
ආදායමේ කොමසාරිස් උන්නාන්සේ.

25 අප්‍රියෙල් 1828, නුවර කච්චේරියේ දීය.

ක්‍රි. ව. 1847 දී ලංකාණ්ඩුකාර ධුරයටපත් වෙකාවුන්ඩ් ටොරින්ටොන් ගරුතර උතුමාණන්වහන්සේගේ කරුණාවෙන් සී. ආර්. බුලර් මධ්‍යම දිශාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් ශ්‍රීමත් දළදා වහන්සේ පිළිබඳව උතුම් ඉංග්‍රීසි ආණ්ඩුවට තුබූ බලය වර්ෂ 1847 ක්වූ ඔක්තෝම්බර මස 2 දින එකලට මල්වතු විහාරාධිපතිව වැඩවිසූ පරකුම්බුරෙ ශ්‍රී විපස්සාභිධාන මහානායකස්ථවිරයන්වහන්සේට සහ අස්ගිරි විහාරාධිපතිව වැඩවිසූ උඩුමුල්ලේ ශ්‍රී රතනජෝතාභිධාන මහානායක ස්ථවිරයන්වහන්සේටද, දුල්ලෑවේ දියවඩන නිලමතුමාටද පවරනලද්දේය.

එතැන් පටන් ඒ උතුමන් ප්‍රධානකොට ඇති බෞද්ධයන් විසින් ඒ ඒ කාලවල දළදාමන්දිරස්ථානයෙ ශ්‍රී දියුණුව පිණිස කටයුතුකරමින් ආරක්ෂාකරගෙන අවුන් ක්‍රි. ව. 1901 දී දියවඩන නිලයටපත් රාජකරුණා චන්ද්‍රශේකර වාසල නාමොපලක්ෂිත කුඩා බණ්ඩා නුගවෙල දියවඩන නිලමේතුමාගෙ ප්‍රධානත්වයෙන් දළදාමන්දිරයෙහි අභිනව දෙමහල් ප්‍රසාදයක් සහ තවත් අභිවෘද්ධිදායී කර්මාන්තයන්ද කරවා පරලෝකප්‍රාප්තවීය.

ක්‍රි. ව. 1916 දී නුගවෙල රාජකරුණාදීන් සමුපලක්ෂිත පුස්වි බණ්ඩා නුගවෙල මැතිතුමා තම

මහනුවර ශ්‍රී හශගිරි (අස්ගිරි)

විජයසුන්දරාරාම මහාවිහාරවශාධිපතිව

වැඩ විසූ

ම හා නා ය ක

මාහිමියන් වහන්සේලාගේ

නාම ලැයිසතුවයි.

1 උරුලෑවත්තේ ශ්‍රී ප්‍රියදර්ශි ධර්මසිද්ධාභිධාන
මහානායක මාහිමියාණන්වහන්සේ

2 ඉඳවලුගොඩ ශ්‍රී ධර්මපාල ,,

3 පොතුහැර ශ්‍රී රතනපාල ,,

4 මාවතගම ශ්‍රී ප්‍රියදර්ශි සොභිත ,,

5 යටවත්තේ ශ්‍රී චන්දජෝති ,,

6 යටංවල ශ්‍රී සුනන්ද ,,

7 කොටගම ධර්මකීර්ති ශ්‍රී ගුණරතන ,,

8 උඩුමුල්ලේ ශ්‍රී රතනජෝති ,,

9 යටවත්තේ ශ්‍රී සුවණ්ණජෝති ,,

10 වත්තේගම ධර්මකීර්ති ශ්‍රී ජිනදාස සුමඞ්ගල

11 යටවත්තේ ශ්‍රී චන්දජෝති ,,

12 කපුලියද්දේ ශ්‍රී ප්‍රියදර්ශි ,,

13 (දැනට) අඹගස්වැවේ ශ්‍රී ධර්මපාල
රතනජෝති ,,

වර්ෂ 1814 සිට 1916 දක්වා

දළදා මාළිගාවේ

දියවඩන නිලය දරූ

උතුමන්ගේ

නාම ලැයිස්තුවයි.

1	කපුවත්තේ අදිකාරම් නිලමෙ	1814—1823
2	ලොකු දෙහිගම නිලමෙ	1824—1827
3	මොල්ලිගොඩ කුඩා මහනිලමෙ	1828
4	කුඩා දෙහිගම නිලමෙ	1829—1835
5	මුල්ලේගම මහඅදිකාරම් නිලමෙ	1836—1842
6	දුල්ලෑවේ මහනිලමෙ	1843—1848
7	ලොකු බණ්ඩා දෙහිගම නිලමෙ	1848—1862
8	කුඩා බණ්ඩා දුනුවිල නිලමෙ	1863—1882
9	කුඩා මුදියන්සේ ගිරුගම නිලමෙ	1882—1897
10	සෙනෙවිරත්න රත්වත්තේ නිලමෙ	1897—1901
11	කුඩා බණ්ඩා නුගවෙල නිලමෙ	1901—1916
12	(දැනට) පුංචි බණ්ඩා නුගවෙල නිලමෙ	1916

ප්‍රධාන සිංහල උත්සව.

1 අලුසල් මඞ්ගල්‍යය. — දුරුතු (ජනවාරි) මසදී පවත්වන "අලුත්බත්" පිළිබඳ උත්සවයයි. සිංහල රජුන් විසින් ගුරුදෙණියේ කෙත කල්මත්තෙන් මේ සඳහා වපුරවනලදි.

2 අවුරුදු මඞ්ගල්‍යය. — අප්‍රේල් මාසයතුළ පැමිණෙන "කෝනා" නමින් ප්‍රසිද්ධ අලුත් අවුරුදු උත්සවයයි. මේ හින්දු භක්තිකයන්ගේ ක්‍රම අනුව පවතී.

3 නානුමුර මඞ්ගල්‍යය. — පවිත්‍ර කිරීමේ හෙවත් පිරිසිදු කිරීමේ උත්සවයයි. අලුත් අවුරුද්ද අනුවම මෙය පැමිණේ. විහාර දේවාලයන්හි තිබෙන පිළිම දෙවරූපාදිය මේ දිනයෙහිදී ආලේප කරනු ලැබේ.

4 පෙරහර මඞ්ගල්‍යය. — ඇසළ (ජූලි-අගෝස්තු) මසතුළ පැමිණේ. පුරාණයෙහි "ඇසළ කෙළිය" නමින් ප්‍රසිද්ධයි. විෂ්ණුදෙවියන්ගේ උත්පත්තිය හා අසුර යුද්ධයෙන් ජයග්‍රහණයද නිමිත්තකොට ඇසළපුර පැලවිය පටන් පසළොස්වක දක්වා පවත්වනු ලැබේ. පසුකාලයක මෙය නාථ, සකන්ද, පත්තිනි, යන දෙවිවරුන්ගේ ගෞරව සඳහාද, ක්‍රි. ව. 1757 දී බෞද්ධ පිළිවෙත් හා මිශ්‍රකොටද යොදනලදි.

5 කාර්තික මඞ්ගල්‍යය. — ඉල් (නොවැම්බර්-දෙසැම්බර්) මසතුළ පැමිණෙන පහන් දල්වීමේ උත්සවයයි. හින්දු භක්තිකයන් විසින් දීපාවලි (පහන් මාලාව) යයි ව්‍යවහාර කරනු ලැබේ.

මෙයින් ඇසළ පෙරහර හැර අනික් උත්සව "නගර මඞ්ගල්‍ය" නමින් ප්‍රසිද්ධව පවතිත්.